# නොසිතූ නිමේෂය



කේ. පි. එස්. එස්. එම්. වී. ඩී.ගයනි ල. ෆඩරීනැන්ඩු

**නොසිතූ නිමේෂය**

ප්‍රථම මුද්‍රණය 2023

**978-624-206-603-5**

ගයනි ලක්ෂිකා ෆඩරීනැන්ඩු

පිට කවර චිත්‍ර - ගයනි ලක්ෂිකා ෆඩරීනැන්ඩු

ජීවිතයේ

උපතේ සිට විපත දක්වා

නොසිතූ වෙලාවක ත්‍රාසජනක ලෙස

සිදුවිය හැකි සිද්ධීන් පිළිබඳ ආශා කරන

ඔබ  සියල්ලන්ටම

**“නොසිතූ නිමේෂය”**

සාදරයෙන් පිළිගැන්වේ.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාවසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. ජාතික අරමුණ මෙන්ම පාසලේ දශර්නයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිට අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් දිරිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන් ම ගත් කතුවරයෙකු හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසලේ සංවිධානය කළ දිරිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන් ම අනාගත දිවියට ශක්තිමත් වේවායි ප්‍රාර්ථනා කරමු.මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධී

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

2023.11.

# 1

ඇඟලෙ සිට දෙපතුල දක්වා පොරවා සිටි අළුවට හුරු රෙදි කඩ හිස දක්වා පොරවාගත් මල්ලි අම්මාගේ හඬ නොඇසුණා සේ සිටියේ ඔහුට හොඳට ම නිදිමත නිසා විය යුතුය.

පැත්තක තිබූ  සම්පූර්ණ කකුල් හතරකින් හා එක් පැත්තක් කිරි වේයන්ගේ හානියට ලක් වූ එය සාරි කඩකින් වසා තිබූ මේසයක් හා අලුතෙන්ම මා වෙනුවෙන් ම සකසන ලද පුටුවක හිඳ එක් අතක් මේසයේ ද අනෙක් අත කම්මුලේ ද දෑස් පොත වෙත ද යොමා සිටියේ ඒ පාඩම මට නොතේරුන නිසාවෙනි.

 අම්මාගේ කෑගැසීම සමග ඇතිවන දෝංකාරය මට මහත් කරදරයකි. එනිසා මම බිම නිදා සිටී මල්ලීට පුටුවෙන් නැගිට ගොස් ඔහුගේ ඉන ප්‍රදේශයට මාගේ කකුලෙන් හෙමින් ගැසුවෙමි. එහෙත් ඔහු නැගිට්ටේ නැත.එනිසා මාගේ මේසයේ පාඩම් කිරීමේදී පාවිච්චියට තිබූ වතුර කෝප්පයෙන් ටිකක් අතට ගෙන එය ඔහුගේ කනේ ගෑවෙමි.එවිට ඔහු මහසෝනා දුටුවා මෙන් නැගිට මාගේ පිට ප්‍රදේශයට පහරක් ගසා ගියේය. මම එය නොදැනුනා සේ සිටියේ මා ඔහුට ගැසුවොත් එහි අවසන් ප්‍රතිඵලය වශයෙන් මල්ලි මට වඩා බාල බැවින් මම ම නැවතත් අම්මාගෙන් ගුටිකා අප්පච්චිගෙන් බැනුම් ඇසීමට සිදු වීමයි.

 මම නැවත පාඩම් කිරීමට පටන්ගත්තෙමි. මෙතෙක් අඳුර පලවා හැරීමට දල්වා තිබූ ලන්තෑරුම නිවා දැමූ මා ජනෙල් තිර ගැට ගසා සුළඟ නිසා බාගෙට ඇරී තිබූ ජනෙල් සම්පූර්ණයෙන් ම  විවෘත

කළෙමි. එයින් පසු සිසිල් සුළඟත් සමග කාමරයට නැවුම් හිරු රශ්මියක් වැටුණේය. මා පොත වසා දමා කුස්සියට ගියෙමි.

එවිට නංගී කුස්සිය මැදින් අවුල් වූ හිසකෙස් සහිත  ව ගොස් පිළිකන්නේ කට සෝදමින් සිටි මල්ලීගෙ වතුර කෝප්පය උදුරා එයින් කට සෝදා ගත්තාය. දෙදෙනා නැවත විත් කුස්සියේ පැත්තක බිත්තියට හේත්තු කර තිබූ බංකුවක හිද ගත්තෝය.

එවිට අම්මා "ඈ.. පොඩ්ඩි මම හැමදාම උබට කියනවා ඔහොම යස්සනී වගේ ඉන්නෙ නැතුව කොණ්ඩය ගැට ගහගන්න කියලා " නංගියි එවිට ඇයගේ මුවින් විකාර ශබ්දයක් නැගුවාය. එවිට හිරමනය මත ඉද පොල් ගෑ අක්කා මෙහෙට වරෙන් යැයි කියා නංගිගේ කොණ්ඩය ගැට ගැසුවාය.

එවිට ඇයගේ මුහුණ  කටු අත්තක් මල් අත්තක් බවට පත්වුණා සේ බැබළිණි. ඒ ඇයට ලැබී ඇති රන්වන් පැහැය නිසා ය. අපගේ පවුලේ එය ලැබී ඇත්තේ නංගිටත් අම්මාටත් පමණයි . අම්මත් ඉස්සර ඒ පාටින් සිටියත් මේ වන විට දැඩි අව් රශ්මියත් විඩාවත් හේතුකොටගෙන  අම්මාගේ මූණෙන් ඒ පාට මැකී ගොස් ඇත.අම්මා කියන්නේ එම පාට ඇයට හා නංගීට කිරිඅම්මාගේ අම්මගෙන් ලැබුණු බවයි.

මම සහ මල්ලී අප්පච්චීගේ හැඩ රුව ලද්දෝ වෙමු. එනම් උස කෙට්ටු තලෙළු හමකින් යුත් අය වෙමු.අක්කාට ඇත්තේ පවුලේ කිසි අයකුට නැති පෙනුමකි .

වෙලාවකට මට ඇය මේ පවුලේ අයෙක් නොවන්නේ දැයි සිතේ. එනමුත් ඇය ඉතා රූමත් තරුණියක් වන්නීය. ඇයගේ ඉන ප්‍රදේශයට වැටී ඇති කොන්ඩෙන් ඇයට අමුතු ම ලස්සනක් එකතු

කරනවාත් සමඟම ඇය අපගේ පවුලේ අයකු බව සනාථ කරයි. මන්දයත් අම්මාට ද ඇයට සමානම කොණ්ඩයක් පිහිටා ඇත.

කුස්සියයේ උලුවස්සට හේත්තු වී ඇත බලා සිටි මා දිහාත් බිත්තියේ එල්ලා තිබූ ඉතා පැරණි මෝස්තරයකින් යුතු කොටු හැඩති ඔරලෝසුව දිහාත් බලා අම්මා

" ගයාන් ඇළට ගිහිල්ලා නංගීයි මල්ලීයි එක්ක මුහුණ කට සෝදාගෙන ඇවිත් ඉස්කෝලෙ යන්න ලෑස්ති වෙයන්" කියා කිව්වා ය.

මා කාමරේ වෙත ඇදී ගොස් එහි පැත්තක එල්ලා තිබූ නිල් පැහැති සළුව ගෙන කුස්සිය වෙත ගොස් නංගි සහ මල්ලි කැටුව අපේ කුඩා පැල්පතට මදක් ඈතින් තිබූ ඇළට යෑමට සැරසුණි.

අම්මා අප්පච්චිට තේ බොන්න එන්න යැයි කියන්න කිව්වා ය. මම එය ගේ ඉදිරිපස මිදුලේ ඇවිදිමින් සිටි අප්පච්චීට කියා නංගි හා මල්ලි සමඟ ඇළට ගියෙමි. මා තනිකර නංගී සහ මල්ලි නිදිමත පසෙක තබා වතුර දැක දියබරි පැටව් දෙදෙනෙක් මෙන් වේගයෙන් දිව්වෝය.

නංගී සහ මල්ලී වතුර දැක නැති සතුන් මෙන් හැසිරෙන්නේ ඇළේ වතුර ටිකක් වැඩි වී තිබූ නිසාය.

"අනේ විකාර නොකර මෙන්න මෙහෙ ඇවිත් දත් මැදලා මුහුණ හෝදා ගනිල්ලා" කියා අවවාද කළෙමි.

මම එය එතන සිටි වැඩිහිටියා ලෙස කීවෙවෙමි. මා එතන සිටි වැඩිහිටියා වූයේ ඒ ඇළ එතරම් පටු නොවුන නිසා ය.ඔවුන් එය

නොඇසුණා සේ සිටියේ ඇතැම් විට මා ඔවුන් සමග එක් වී සෙල්ලම් කරන නිසා විය යුතුය.

මම තනියම ඇළ හරහා වැටී ඒදණ්ඩ ලෙස සැකසී තිබූ කොට්ටා ගස දිගේ ගොස්  ඇළේ අනෙක් පැත්තේ  තිබූ  කරඳ  ගසින් කෝටු තුනක් කඩා මෙගොඩට පැමිණියෙමි .දිය බල්ලන් ලෙස වතුරේ නට නටා සිටී නංගිට සහ මල්ලීට  කරඳ  කොටුව බැවින් දී මමත් එහි කොනක් සපා එය බුරුසුවක් කර එයින් දත් මැද්දෙමි.

දෝතට ගත් ජලයෙන් මුහුණ සෝදා ගත් මම නිල් පැහැති සළුවෙන් මුහුණ පිස දා ගතිමි.මල්ලී සහ නංගි සීතල නොතකා ඇළට බැස සිටියේ ඔවුන්ගේ ශරීරයේ බාගයක් පමණ තෙත් කර ගනිමිනි.

 අම්මා නංගිගේ සහ මල්ලීගේ වගකීම මා හට පැවරුවේ මා හට තිබූ විශ්වාසය නිසාවෙනි. එහෙත් ඔවුන්ගේ ඇඳුම් දුටුවොත් ඔවුන් ටත් වඩා මට බනිනවා නොඅනුමානයි.  එනිසා මම ඔවුන්ට අම්මාට නොපෙනෙන ලෙස ගොස් ඇඳුම් මාරු කර කෑමට එන ලෙස අවවාද කළෙමි. එහෙත් ඔවුන් මා පිළිබඳ  අනුකම්පාවක් නොකරනු ඇතැයි සිතුවත් ඔවුන්ටත් බැනුම් අසන්නට වේ යන බයෙන් ඉක්මනින් දිව ගොස් පාසල් ඇඳුම් ඇඳ කෑමට පැමිණියෝය.

මම කිසි කලබලයකින් තොරව කුස්සියට ගොස් කුස්සියෙ දොර මුල්ලේ ඉඳ ගත්තෙමි. අම්මා මට උණු උණු බත්,සම්බෝල හා කරවල සහිත බත් පිඟානක් අතට දී මාගේ ඔළුව අතගා "කාපන්" ලෙස කීවාය. වෙලාවකට මා හට අම්මා වැඩියෙන් මට ආදරෙයි යැයි සිතේ එසේ නම් එයට ප්‍රධාන කාරණය මම අම්මා කියන

සියල්ල කීකරුව සිදුකරන නිසා විය යුතුය.  අම්මාගේ ආදරය අඩු කර ගැනීමට මම වැඩ නොකරමි.

අප්පච්චි නම් අපි හතර දෙනාට ම එකම හැන්දෙන් ආදරය බෙදයි. එනමුදු නංගි අප්පච්චි ළඟ දැවටි ආදරය අංශුමාත්‍රයක් වැඩියෙන් ලබා ගනී.

එයට මගෙන් කිසිදු බාධාවක් නැති නමුත් මල්ලි එය දෙස බලා ඊර්ෂ්‍යා කරයි. මන්ද යත් සමහර අවස්ථාවල නංගීට විවිධ වාසි සිදු වී එවිට ඇය ඇයට ලැබුණු වාසි පෙන්වා ඔහුට ඇද කරයි.  වාසි ලෙස සලකනුයේ කොණ්ඩා කටු ,මාල, වළලු  මෙන්ම  සීනි බෝල කෑමට ලැබෙන සතවිසි  පහ  ආදියයි.

මල්ලී අප්පච්චි සමඟ එතරම් හිතවත් නොවුනත් මල්ලිටත් අප්පච්චි ආදරෙයි කියා මට සිතේ.මල්ලිත් අප්පච්චිගෙන්  ඔහුට අවශ්‍ය දෙය ඉල්ලුවොත් නොලැබෙනවා නොඅනුමානයි .එහෙත් ඔහු එසේ නොකරන නිසා අප්පච්චි ඔහුට ඒවා අවශ්‍ය යැයි නොසිතයි.

මෙලෙස සිතමින් බත් පිඟානේ බත් කොනක සිට කෑමට ආරම්භ කළෙමි. කෑමෙන් පසු ඉතිරි බත් ටික බිංදුට අනා දැම්මෙමි. බිංදු අපගේ ගෙදර සිටින සුරතල් බලු පැටියා ය.  සුදු  පැහැති ශරීරයේ තැනින් තැන ඇති කළු පැහැති බිංදු නිසා ඌට  බිංදු යන නම මල්ලී විසින් පටබඳින ලදි . නංගි විසින් එය අනුමත කරන ලදී.

එළියේ තිබූ වතුර භාජනයෙන් පිඟාන සෝදා එයින්ම වතුර බී මම ඉතිරි වතුර ටික ළඟ තිබූ මල් පැලයකට දැම්මෙමි. ඉන්පසු සාලෙ පැත්තක තිබුණු පුටුවක දමා තිබූ  පාසල් ඇඳුම රැගෙන කාමරයට ගොස්  එහි බොත්තම් එකින් එක දමා මාගේ සහ මල්ලිගේ කාමරේට එහා පැත්තෙන් පිහිටා තිබූ  නංගිගේ අක්කාගේ සහ

අම්මාගේ කාමරයෙ බිත්තියේ එල්ලා තිබූ කණ්නාඩියෙන් මුහුණ බලා කොණ්ඩය අතින් සකසා ගතිමි.

මාගේ කාමරයේ තිබූ එකම වටිනා වස්තු වූ පාසල් බෑගය හා සපත්තු දෙක රැගෙන පාසල් බෑගයට අවශ්‍ය බඩු භාණ්ඩ දමා සූදානම් වූයෙමි. මා පහ ශ්‍රේණිය විභාගයෙන් සමත් වී ටවුමේ ඉස්කෝලේ යාමට වාසනාවන්ත වූ නිසා මේ සියලු සම්පත් මට ලැබිණි.

අවසාන වශයෙන් සපත්තු දෙක දමා ගත් මා අම්මමා වැඳ අප්පච්චී හට කතා කළෙමි. මා අප්පච්චී සමඟ බයිසිකලෙන් ඉස්කෝලෙට අතර නංගි සහ මල්ලි පසුව අක්කා සමග ඉස්කෝලේ ට යති.

නංගි සහ මල්ලි හට මා තරම් සම්පත් නොවුනත් ඔවුන් මා සේම ටවුමේ ඉස්කෝලේට ගියා නම් අම්මා කෙසේ හෝ ඔවුන්ගේ අඩුපාඩුකම් ද සලසා දෙනවා නිසැකය.ඔවුන් පොලිතීන් කවරයක පොත් දමා ගෙන යන අතර සපත්තු වෙනුවට බාටා කැබලි දෙකක් කකුලට දමා ගනී. අම්මා මා හට මේ සියලුම සම්පත් ලබා දෙන්නේ මා හට මදිපාඩුවක්වේ යැයි යන බයෙනි.

අක්කා පාසල් නොයාමට හේතු රාශියක් ඇත. එයට ප්‍රධාන ම හේතුව නම් ඇය ඉගැනීමට අලස සහ දක්ෂ නොවූ අතර හදිසියේ ම හටගත් ප්‍රේම සම්බන්ධතාවක් නිසා අප්පච්චි ඇයව පාසල් නොවූවාය. මුලමුලදී ඇය හඬා වැලපුන ද පසු කලෙක එම තීරණය ගැන ඇය සතුටු වූයේ ඇය අධ්‍යාපනයට දැක්වූ අකමැත්ත නිසා වෙනි. ඇය ගෙදර සිට පවුලේ ආර්ථික තත්වයට උදව් කළාය.

# 2

බයිසිකලයෙන් ගොස් පාසලේ නම ප්‍රදශර්නය කර ඇති විශාල පුවරුවට මදක් ඈතින් බයිසිකලය නවතා මා බයිසිකලෙන් බැස අප්පච්චී හට වැඳ බැගය කරේ දමා පාසලට ඇතුලු වූයෙමි.

ගමේ ඉස්කෝලේ මෙන් නොව ටවුමෙ ඉස්කෝලෙ ට පා තබන විට මාගේ සිතට අභිමානයක් ලැබේ. හමුවන ගුරු මහතුන්ට හා පාසලේ අනෙකුත් කායර් මණ්ඩලයේ සියලු දෙනාට හා මාගේ යහළුවන්ට සුභ උදෑසනක් කියා ආමන්ත්‍රණය කර මා පන්තිය කරා පිය නැග්ගෙමි.

මා පංතියට යනවිට එහි ළමයි දොළහක් පමණ සිටියෝය.මා ද ඔවුන්ට එක්වී සතුටු සාමීචි කතාවක නිරත වූයෙමි.එය බාලක පාසලක් වූ හෙයින්අපගේ කතාවට බාධා කිරීමට එහි කිසිම ගැහැණු ළමයෙක් සිටියේ නැත.

ඊට සුළු මොහොතකට පසු මාගේ හොඳම යහළුවා වන චාමර පන්තියට පැමිණ මාගේ පිට ප්‍රාදේශයට තට්ටු කළේය. ඔහු ගමේ මුදලාලිගේ පුතා වූ බැවින් ඔහුද මේ ඉස්කෝලෙට පැමිණියේය.ඔහු දක්ෂ,පරාතර්කාමී මා හට හොඳ යහළුවෙක් වූයේය. පන්තියේ දී අපි දෙන්නා ඉදි කටුවයි නූලයි ලෙස හැසිරෙන නිසා පන්තියේ අනෙක් ළමයින් අපට කවට කමට ‘අප්පච්චි පුතයි’ ලෙස නමක් පටබැඳ ඇත. ඔහු අප්පච්චි වූ අතර මම පුතා වූයේ ඔහු මට වඩා අඟල් දෙකක් පමණ උස වූ නිසා ය.චාමර මා හට "ගයාන්" කියා අමතයි .හැබැයි සමහරු මා හට ‘ගෙම්බා’ යැයි කවට කමට කියයි.

චාමර පැමින සුලු වේලාවකට පසු  සීනුව නාද විය.ඉන්පසු තිබූ කාල කාලච්ඡේද හතර තුළ අපි පාඩම් ඉගෙන ගත්තෙ මු. එහිදී මා හට උදැසන නොතේරුන පාඩම  විද්‍යාව සර් විසින් පැහැදිලි කර දුන්නේය.

 විවේක් කාලය ඇරඹිණි සමහරු විවේකයට ගනු පිණිස ආහාරයත් රැගෙන එති. මා එසේ නොකරන්නේ මා උදයට හොඳින් ගෙදරින් කා පැමිණෙන  නිසාය.චාමර ද එසේය.

විවේක කාලයෙන් පසුව ගණිතය කාලච්ඡේදය ආරම්භ විය.ගුරුතුමිය විසින් පාඩම කියාදුන් අතර ඇතැම් සිසුන්ට එය අවබෝධ නොවුණි .එනිසා ඇය මා හට එය   අවබෝධ නොවූ ශිෂ්‍යයන් කියා දෙන ලෙස පැවසුවාය. මා ගණිතයට දක්ෂ වූ බව පන්තියේ කා අතරත්  ප්‍රසිද්ධය. මා සාමාන්‍යයෙන් පන්තියේ පළමුවෙනියා හෝ දෙවනියා වෙන්නෙමි.

ඉන්පසු තිබූ කාල කාලච්ඡේද අවසන් වූ පසු පාසල ඇරී චාමර සහ මම ගහක් යට සෙවනේ බසය පැමිණෙන තුරු බලා සිටියෙමු. ඇතැම්  දිනවල බසය නොපැමිණියහොත් අප දෙදෙනා තනිවම පාගමනින් ගෙදර යන්නෙමු.

අපි ගස යට සිටින විට බසය පැමිණි හෙයින් අප දුව ගොස් බසයට නැග්ගෙමු.ඉන්පසු අපි බස් රිය එයින් ගමෙ පන්සල ළඟට පැමිණ එයින් බැස ඒ අසල තිබූ ගුරු පාර දිගේ  ගෙදර බලා පා ගමනින් පිටත් වීමු.

යන අතරමග මීටර තුනක් පමණ උසට වැඩුණු ඇඹිල්ල ගස දුටු මාත් චාමරත් ගස වටා අපගේ දෑස් කැරකුවෙමු. එහිදී චාමර හට

කළු පැහැති ඉදුණු හීන් ඇඹිල්ල ගෙඩි පොකුරක් හම්බ වුනේ ය. ඔහු එය ගයාන් යැයි හයියෙන් කෑ ගසා කටේ දාමා ගත්තේය.

මම ඔහු දෙස බලා රැව්වෙ ඔහු මා හට නොදී ඇඹිල්ල කෑ නිසාය. ඉන්පසු මම මාගේ දකුණු අත පැත්තේ තිබු කහ පැහැයට හැරී තිබූ ඇඹිල්ල ගෙඩි කීපයක් ගෙන එය කටේ දමා ගත්තෙමි.එයින් මගේ කට ඇඹුල් විය.

ඉන්පසු අප දෙදෙනා ඉදිරියට යාමට සැරසෙද්දී චාමර විසින් මා හට හොඳින් ඉදුණු කළුපැහැති හීන් ඇඹිල්ල ගෙඩි කිහිපයක් දික් කළේය. මා එය සිනාමුසු මුහුණින් අතට ගත් විගස එය කට ට දමා ගත්තේ මාගේ කටේ රැඳී තිබූ ඇඹුල් ගතිය නික්මී පැණි රසයෙන් කුල්මත් වේ යන අරමුණිනි. එය කෑමෙන් අනතුරුව මාගේ කට පැණි රසින් කුල්මත් වූනි.

චාමර මා දෙස සිනහමුසු මුහුණින් බලා" ගයාන් ඔයා අද කෝපි කඩනවද? " යැයි ඇසුවේය.

ඔහු එසේ ඇසුවේ අපගේ ප්‍රධාන ආර්ථික වාසිය වූයේ වතු බද්දට ගෙන එහි එල නෙළා විකිණීම නිසවෙනි. මේ දිනවල සෝමසිරි මාමලාගෙ වත්තෙහි කෝපි කැඩීම අපට පැවරී තිබිණි.

"ඔව් ඇයි චාමර එනවද? "යැයි මම ගත් කටටම ඇසුවේ චාමර පැමිණි විට මාගේ විඩාව අඩු කරගනිමින් විහිළු තහළුවෙන් කෝපි කැඩීමට හැකි නිසයි.

" ඇඳුම් මාරු කරලා කාපු ගමන් ඔයාලගේ ගෙදර " යැයි චාමර කීවේය.

“ හා හා මතක් කරලා එන්න ඕන ” මම ඔහුට සතුටින් කියා සිටියෙමි.

ගුරු පාර දිගේ මදක් දුර යන විට චාමර ඇල වේල්ල පෙන්වා “අපි එතනට දුවන තරගයක් තියමුද?”ඇසුවේය.

මම එයට කැමැත්ත ප්‍රකාශ කළෙමි.

ඉන්පසු අපි තරගෙට දිව්වෙමු. ඉන් මා හට චාමර පසු කළ හැකි විය. මා ඔහුගේ සිත සැදීමට උත්සාහ කළ ද ඔහු මා හට ඒ වෙනුවට අවවාදයක් දුන්නේය.

“ඒකට කමක් නෑ ගයාන් දිනන මනුස්සයෙකුත් ඉන්න ඕන තරඟයක පරදින මනුස්සයෙකුත් ඉන්න ඕන නේ ”

මම එයට හිස සොලවා පිළිතුරු දුන්නෙමි.

ඉන්පසු අපි එතැන තිබූ ඇල වේල්ලෙන් බැස විඩාව දුරුකර ගැනීමට වතුර ටිකක් බිව්වේමු. ඉන්පසු විනාඩි 5ක් පමණ එහි සිටි කුඩා ගප්පි පැටව් දිහා බලා සිට නැවත ගෙදර බලා පැමිණියෙමු. අප දෙදෙනා විසින් මාළු ගැන කතා කරමින් ගෙදර ආ අතර කතාවක් සමග ගෙදරට ළඟා වීමු.

මම ගෙදරට ළඟාවන විට “එහෙනම් කෝපි කඩද්දි හමුවෙමු.” යැයි කීවෙමි.

“හා හා එහෙනම් මම එනවා” යැයි චාමර කියා ගියේය.

# 3

**මා** ගෙදර මිදුල ඉදිරිපස ලී වලින් සකසා තිබූ වැටෙන් මිදුලට ඇතුළුවන වාත් සමගම  නංගී සහ මල්ලි කෑම කන්න ස්ථානය අසලින් හොම්බ බිම තබා සිටි බිංදු මා වෙත පැමිණ මා පැමිණීමේ සතුට ඌ විසින් ප්‍රකාශ කළේය. ඌ එය ප්‍රකාශ කිරීම සඳහා බොහෝ සෙයින් උගේ වලිගය යොදාගත්තේය.

මම උගේ ආරාධනාව පිළිගත්තා සේ උගේ ඔළුව අත ගා ගෙදර තුළට පැමිණියෙමි. මා ගෙදර යන විට මල්ලි සහ නංගි පාසල් ඇරී ගෙදර ඇවිත් සිටියෝය. නංගි පාසල් යාම සඳහා සකසන ලද කොණ්ඩයේ සිට ම කෑම කකා සිටියාය.

මල්ලි හට බත් පිඟානක් බෙදා තිබුණද පවුලේ බාලයා වශයෙන් නංගී විශේෂ සැලකිලි ලැබීමට දක්ෂ වූ බැවින් අම්මා නංගිට බත් කවමින් සිටියා ය . මම කාමරේට ගොසින් පොත් බෑගය හා සපත්තු ගලවා ඇඳුම් මාරු කරගත්තෙමි.

උඩුකය නිරුවත්ව සිටින්නේ එයින් මාගේ විඩාව රස්නය අඩු වන බැවිනි. මීළඟට මම එක එල්ලේ තවමත් නංගී හට බත් කවමින් සිටි අම්මා වෙත ගොස් බත් කටක් යැයි කියා මුව ඇර අම්මාගේ අත ළඟට ලන් කළෙමි.එවිට නංගී අම්මා ඇයට පමණක් අයිති ලෙස ඇයගේ මුවෙන් මාගේ ක්‍රියාවට අකමැත්ත ප්‍රකාශ කිරීමට ශබ්දයන් නැගුවාය.

අම්මා මා හට ඇති ආදරේ නිසා බත් කටක් කටට ඔබා " පොඩි එකා නොවී ගිහින් මේසෙ උඩ තියෙන බත් එක කාපන්" යැයි කීවාය.

ඉන්පසු මා විසින් කුස්සියට ගොස් තවත් පිඟානකින් වසා තිබූ මාගේ බත් පිඟාන රැගෙන නැවත මාගේ පාලුව මකා ගැනීම සඳහා නංගී සහ මල්ලී සමඟ සිටි අම්මා වෙත ගොස් කෑම ආරම්භ කළෙමි.

කෑම කන අතරතුර  මම අම්මාට චාමර අද කෝපි කැඩීමට පැමිණෙන බව පැවසුවෙමි. කා අවසානයේ පිගාන සෝදා තබා වතුර බොන විට අම්මා විසින් මා හට කෙසෙල් ගෙඩියක් දික් කළා ය.

එය මම ලෙලි අරිමින් නිවස පිටතින් ගෙමිදුලට ගොස් එහි පැත්තක තිබූ අඹගස යට මීට සතියකට පෙර අප්පච්චිගේ උපදෙස් අනුව මා විසින් සකසන ලද බංකුවේ වාඩි වී කෙසෙල් ගෙඩිය කෑවෙමි. මම කෙසෙල් පොත්ත අඹ ගස යටට දැමුවේ කෙසෙල් පොත්තේ ඇති පොහොර මය වටිනාකම නිසා ය.

මම ඈතින් එන චාමර දුටු බැවින් ගේතුලට ගොස් කමිසයක් දමා ගත්තෙමි. මම නැවත පැමිණෙන විට චාමර පැමිණ සිටියේය. අම්මා විසින් චාමර ව සිනාමුසු මුහුණෙන් පිළිගත්තාය.

" ආ අද චාමර පුතත් ඇවිල්ලා තියෙන්නේ"

"ඔව් නැන්දේ ගෙදරට වෙලා ඉන්න කම්මැලි ඒකයි "

"අප්පච්චි අපිටත් එක්ක බනීද දන්නේ නෑ පුතාව මේ වැඩ වලට අරන් "

“අප්පච්චි තමා කිවුවේ ගෙදරට වෙලාම ඉන්නේ නැතුව කොහේ හරි යාළුවොත් එක්ක යන්න කියලා. ඉතින් මට ඉන්න හොදම යාළුවා චාමර නිසා තමයි ආවේ ”

මේ සියල්ල ඔවුන් විසින් කතාකරද්දී මම ඔවුන්ට පැත්තකින් සිටියෙමි.චාමරගේ අවසාන කතාවට නම් මා හට හීන් සතුටක් සමග ආඩම්බරයක් දැණිනි. ආඩම්බරයට හේතු වූයේ ඔහු ගමේ මුදලාලිගෙ පුතා වූ බැවින් එලෙස ඔහු මා මිතුරෙකු ලෙස පිළිගෙන ඇති නිසා මා හට සතුටක් දැනුණි.

ඉන්පසුව අපි අම්මා විසින් කුස්සියට ගොස් අප්පච්චිට දෙන ලෙස දුන් තේ පෝච්චිය හා කෝප්පය රැගෙන කෝපි වත්තට ගියෙමු. සිරිසෝම මාමලාගේ කෝපිවත්ත අපේ ගෙදර සිට විනාඩි දහයක පමණ දුරකින් පිහිටා තිබුණේය. චාමර සමඟ කතා කරමින් යන විට නොදැනුවත්ව ම කෝපි වත්ත ළඟට ගොස් තිබිණි.

ඉන් පසුව මම එය විශාල කෝපි වත්තක් වූ බැවින් අප්පච්චි සොයා ගැනීමට “අප්පච්චි අප්පච්චි…”ලෙස කීප වරක් ශබ්ද කළෙමි . එවිට අප්පච්චි මේ එනවා යැයි කෑගැසුවේය.

උදේ සිට කෝපි කැඩුව නිසා අප්පච්චගේ මුහුණෙන් විඩාව පෙන්නුම් කෙළේය. ඔහු අප අසලට පැමිණීමෙන් පසු චාමර හොඳින් දැක ඇති නමුත් ඔහුව හොඳින් හඳුනාගැනීමට නොහැකි බව පැවසුවේය.

එයට හේතුව නම් අප්පච්චි විසින් බොහෝ විට කඩේට නොයන අතර අම්මා එම කායර්යට බැඳී ඇත. එනිසා අම්මා හොඳින් චාමර දැන සිටියත් අප්පච්චි විසින් ඔහුව දැක ඇති නමුත් ඔහු කාගේ

කවුදැයි නොදනී. ඉන්පසු මා විසින් චාමර ව ඔහුට හඳුන්වා දෙන ලදී.

හඳුන්වාදීමෙන් අනතුරුව චාමර අප්පච්චී සමඟ කතා කළේ ඔවුන් මීට අවුරුදු ගානකට පෙර දන්නා ලෙසයි. එය චාමරගේ විශේෂ දක්ෂතාවයකි. යමෙක් කතාවට අල්ලා ගැනීමට ඔහු සෑම විට ම භාවිතා කරයි. එය ඔහුට ඔහුගේ පියාගෙන් ලැබුනු දෙයකි.

ඔවුන්ගේ කතාවට බාධා ඇති වෙතැයි සිතා මම නිහඬව සිටියෙමි.

ඉන්පසු "අප්පච්චි තේ ටිකක් බොමුද?" කියා මම ඇසුවෙමි.

" හා හා වක් කරපංකො " අප්පච්චි විසින් පවසා මා අම්මා විසින් දුන් කෝප්පය රැගෙන එයට කේතලෙන් තේ වක්කරන විට අප්පච්චි ගසක් යට වාඩි වූයේය.

ඉන්පසු මා විසින් තේ කෝප්පය අප්පච්චිට දී චාමර සහ මම කෝපි වත්ත බැලීමට ගියෙමු.

ඊයේ පෙරේදා යන දවස් දෙකහිම කෝපි කැඩූ නිසා අද දින අපට කෝපි කැඩීම ඉවර කර ගත හැකි වේ යැයි සිතුනි .ඉන්පසු මා විසින් චාමරට කෝපි කැඩීමට ඉතිරි වී ඇති කොටස පෙන්වා කෝපි කඩන ආකාරය කියා දුනි.

චාමර ඔහුගේ වැඩ පෙන්වීමට විශාල කෝපි ගසකට නැග්ගේය. ඉන්පසු මාත් ඒ අසල ම තිබූ තවත් කෝපි ගසකට නැගුණි. අප දෙදෙනා කෝපි ගසේ ම සිට කතා කළෙමු.විනාඩි දහයකට පමණ පසු අප්පච්චි පැමිණෙන විට අපි කෝපි ගසින් බැස ඉදුණු අමු කෝපිවල රස බලමින් සිටියෙමු.

“ හා හා දැන් වැඩ පටන් ගමු එහෙනම්. චාමර පුතා එහෙනම් බලන් ඉන්න ” එය අප්පච්චි චාමර දෙස බලා කීවේය. එය මට පුදුමයක් වූයේ අප්පච්චි කියූ දේ නොව ඔහුට චාමර ගේ නම මතක තිබීමයි.

මම චාමර දෙස බලා මඳ සිනාවක් පෑවෙමි.

චාමර “ එහෙනම් අද මම එන්නෑනේ මාමේ”

“පුතාගේ කැමැත්තක්” යැයි අප්පච්චි චාමරට පවසා අපි වැඩ ආරම්භ කළෙමු.

ඉන් සුළු මොහොතකට පසු අම්මා ආවාය.“අයියේ තේ බිව්වද?” ලෙස අප්පච්චිගෙන් අසා අප දෙස බලා මද සිනාවක් පෑවා ය.

අප්පච්චී “ඔව් බිවුවා තේ පොච්චියයි කෝප්පෙයි අතන ඇති ගිහින් ගනිං.” යැයි කීවේය.

අම්මා විසින් එම තේ පෝච්චිය සහ කෝප්පය අප අසලට ගෙන එය බිම තබා ඇය ද කෝපි කැඩීමට ආරම්භ කළාය. අපි සවස් කාලය වෙනතුරු කෝපි කැඩුවෙමු.ඉන්පසු අපි ගෙවල් බලා පිටත් වුනෙමු.

මෙලෙස දවස නිමා වීමත් සමග ඊළඟ දවස ආරම්භ විය අපි සුපුරුදු පරිදි මුහුණ සෝදා පාසල් ගියෙමු.

# 4

එය එතරම් විශේෂ දිනයක් නොවුනත් පාසලේ උදය රැස්වීමේදී අප අවුරුදු පතා යන චාරිකාව පිළිබඳ විදුහල්පතිතුමා විසින් අපව දැනුවත් කළේය. පෙර වසරවල් වල මෙන් නොව මේ වසරේ අපි දුර ගමනක් යෑමට තීරණය කළෙමු. එනිසා එයට පාසලෙන් මුදලක් අය කර ගනී.

පාසල නිම වී සුපුරුදු පරිදි බස්රිය පැමිණෙන තුරු සිටි චාමර සහ මම ගුරු පාර දිගේ ආවෙමු .අප දෙදෙනා විසින් අද දින පෙරදින අප විසින් කෝපි කැඩීම ගැනත් චාරිකාව ගැනත් කතා කළෙමු. පෙර දිනයේ මෙන් අපට ගුරු පාර දිගේ පැමිණෙන අතර කුසට භෝජනයක් නොතිබුණි.

මා චාමර ගෙන් සමුගෙන ගෙදරට ගියෙමි. බිංදු විසින් මා පළමුව පිළිගත් අතර ඉන්පසු මා හට අද දින කිසිදු විශේෂ වැඩක් නොතිබූ නිසා නංගී මල්ලී සහ අක්කා සමඟ ඇළට ගොස් නෑ වෙමු.

මල්ලී සහ නංගී අක්කා හා මට පළමුව ඇළ වෙත ගියේ ඔවුන්ට නෑමට ඇති අවශ්‍යතාවය නිසා නොවේ ඇළ ළඟ වැටි ඇති කොට්ටම්බා ගහෙන් කොට්ටම්බා ඇහිලීම අරමුණු කරගෙනයි.

නංගි විසින් ඇය එකතු කරන කොට්ටම්බා මල්ලි වෙත භාරදේ මල්ලි ඒවා එකින් එක ගෙන ඒවා බිම තබා එයට තවත් ගල්කින් පහර දී කොට්ටම්බා ගෙඩිය මැද ඇති සුදු පැහැති මදය ගෙන ඔහු සහ නංගී එය කන්නෝය .

කොට්ටම්බා ගෙඩිය වෙත එල්ල කළ පහරකින් මල්ලිගේ අත් තුවාල වුණි. ඉන්පසු රෙදි සෝදමින් සිටි අක්කා ඔවුන් වෙත කඩා පැන මල්ලිගේ අත බැලුවාය. ඇය එසේ කලේ ඇය එතැන සිටි වැඩිහිටියා බැවිනි.

ඉන්පසු මා විසින් නංගි විසින් එකතු කරන ලද කොට්ටම්බා ගෙන එහි මදය මල්ලිටත් නංගීටත් අක්කාටත් දී මමත් කැවෙමි.මල්ලි ඇහැඬීමට සැරසුන ද නංගි සිටි බැවින් ඔහු එය නතර කර ගත්තේ ඇය අඬන විට මල්ලි විසින් ඇයට කොලොප්පන් කරන බැවිනි.

ඉන්පසු අපි නා ගෙදර ගියේ අපට තිබූ බඩගින්න නිසාවෙනි. ගෙදර යන විට අම්මා අපට බත් බෙදා තිබුණා ය.අක්කා කලින් කා තිබූ අතර නංගී හා මල්ලි තවම කා තිබුණේ නැත.

මම බත් පිඟාන ගෙන කන අතරතුර අම්මාට පාසලේදී වාරිකාව ගැන කියූ විස්තර ඇයට කියා සිටියෙමි. අම්මා බිම බලා "බලමුකෝ" යැයි පැවසුවාය.

මේ දිනවල අලුතින් ගස් වල ගෙඩි කඩා වැඩ පටන් ගෙන ඇති අතර එහි ප්‍රතිලාභ තව ම ලැබී නැති නිසාත් කලින් එකතු කරගත් මුදල් මේ වන විට අවසන් වී ඇති නිසාත් දැන් පවතින්නේ සුළු මුදලක් වන හෙයින් එය භාවිතා කළ හැක්කේ කෑමට පමණක් නිසා අම්මා එසේ මා හට පිළිතුරු ලෙස දුන්නා විය යුතුයි.

මම එය නැවත වරක් අම්මගෙන් නො ඇසුවෙමි .

මම පාසලේ වැඩ කිරීමට පටන් ගත්තෙමි. හවස් වූ පසු අප්පච්චි ඊයේ දවසේ ඉතුරු වුණ කෝපි ගස් දෙක තුනේ කෝපි සියල්ල කඩා ගෙන නැවත ගෙදර පැමිණියේය. ඊයේ දින අපි කෝපි කඩා

ඉවර කිරීමට සිතුවත් එය කරගත නොහැකි වූ බැවින් අද දින අප්පච්චි විසින් කෝපි ටික කඩා නිමකර ගෙදර පැමිණියේය.

“තේ ටිකක් හදන්නද"යැයි අම්මා ඇසුවාය.

කාමරේ පාඩම් කරමින් සිටි මම එය ඇසීමෙන් අප්පච්චි ඇවිත් ඇති බව දැනගත්තෙමි.ඉන්පසු මම නංගි සහ මල්ලි සිටි තැනට ගියෙමි. එවිට නංගී මා හට වඩයක් දික් කළාය. මම එය කා අම්මා විසින් සකසන ලද තේ කෝප්පය බිව්වේමි.අම්මා අප්පච්චිගෙන් "කෝපි ගස් ගොඩක් තිබ්බ නිසාද අද පරක්කු වුනේ.. කිව්වනම් මමයි පුතයි එනවනේ"කිවුවා ය.

එයත් සමග අප්පච්චි දුන් පිළිතුර නිසා මාගේ හිත සතුටින් හා විනෝදයෙන් පිරුණේය.

“නෑ නෑ කෝපි ගස් ටික නම් මං පැයෙන් දෙකෙන් කඩලා ඉවර කළා සිරිසෝම අයියලාගේ කුඹුර හාන්න එන්න කිව්වා නේ ඊට පස්සෙ මම කඩමන්ඩිය පැත්තටත් ගියා ඒකයි පරක්කු උනේ” යැයි අප්පච්චි පිළිතුරු දුන්නේ ය.

කුඹුර හෑම මාගේ පමණක් නොව ගමේ ඇතැම් ළමයින්ගෙ සතුටට හා විනෝදයට හේතුවක් විය. එයට හේතුව නම් ළමයි සියලුම දෙනාම එක් වූ විට හොඳින් සෙල්ලම් කර විනෝද විය හැකි නිසයි.

මීළඟට අම්මා විසින්“හ්ම්...කීයක් හරි හොයා හොයා ගන්න පුළුවන්.. එහෙනම් හෙට අපි කෝපි වේලෙන්න දමා යමු” යැයි අම්මා කීවාය.

මා කුස්සියෙන් නික්මී සාලයට යන විට අම්මා අප්පච්චිට චාරිකාව ගැන කියනවා මට ඇසිණි.මා හට පෙනෙන්නේ එය අම්මාට මහත්

හිසරදයක් බවට පත් වී අවසානයි කියයි .එනිසා මම චාරිකාව පිළිබඳ බලාපොරොත්තු අත්හැර ගත්තෙමි.

# 5

ඊළඟ දවසේ උදේ පාන්දරම නැගිට පාඩම් කළෙමි. මම දවසේ ඉතිරි පැය කීපය ගැන සිතා හිතින් සතුටු වුණෙමි.හිරු මුදුන් වීමත් සමඟ මමත් අප්පච්චි ත් මල්ලීගේ සුළු උදව් ඇතිව කෝපි වේලෙන්නට දමා කුඹුර හැම ට ගියෙමු.

කුඹුරු හැම සඳහා ළමයි කිහිප දෙනෙක් එක් වී සිටියෝය. ළමයි ඌරු පැටව් මෙන් මඩ නැවෝය. මමත් ඔවුන් හා එක් වී එම ක්‍රියාවේ ම යෙදුණි .එසේ කරන විට වැඩිහිටියන් අප දෙස බලා සිනාසුනි.

වැඩිහිටි පිරිස් කුඹුර හැම ට පටන් ගත්තෝය. නංගී හා මල්ලි හට ඔවුන්ගේ වයසේ ඔවුන්ට ගැලපෙන යහළුවන් හමු වී තිබිණි. ටික ටික දහවල් කාලය එළැඹිණි දහවල් කාලයේ කෑම සූදානම් කර අම්මා අක්කා සහ තවත් නැන්දලා ටිකක් කෑම රැගෙන ආවෝය.

අපි සැවොම ගසක් යටට ගියෝය.ගස අප සියලු දෙනාටම සෙවන සැප වූයේය. අම්මා කොලපතක් අප අත තබා එයට බත්,පපඩම් ,පරිප්පු සහ පොලොස් ඇඹුලක් ඒ මතට දැම්මාය.මට එය රාජ භෝජන වැනිය .

මම තවත් ළමයි කිහිප දෙනෙක් සමග එකතු වී එහි රස බැලුවෙමි.වාලට් නැන්දා ඉන්පසු අප සියලු දෙනාට ම එකාට එක බැගින් කෙසෙල් ගෙඩියක් දුන්නාය. එය සප්පායන් වී අපි මදක් විවේක ගෙන වැඩ ආරම්භ කළෙමු.

කෙමෙන් කෙමන් හවස් වරුව ළඟා වූයේය. ඉන්පසු හවස් වරුවේ කොට්ට කිරිබත් හා තේ කෝප්පයක් ලැබුණි. මා එය ආසාවෙන් කෑවෙමි. ඉන්පසු මට දැනුනේ අවුරුද්දේ දවස් වලින් ප්‍රියතම දිනයක් වන මෙදින අවසන් වී ගෙන යන බවයි ඉන් මාගේ සිතට යන්තම් දුකක් දැනිනි.

අප්පච්චි සහ මාමලා වැඩ අවසන් කිරීමෙන් පසුව ලොකු කුඩා සියලු දෙනාම එක්වී වැවෙන් දිය නෑවෝය .දිය නෑමෙන් පසු මා පිළිබඳ මා තුළ තිබූ පිළිකුල් සහගත ගතිය නික්මී ගියේය. ඉන්පසු සියලු දෙනාම සතුටින් තම තමන්ගේ නිවෙස් කරා ගියෝය.

අපි ගෙදර යන විට අම්මා විසින් රෑට කෑම සූදානම් කර තිබුණි. උදේ සිට සවස් වනතුරුම ගෙදරින් හැදූ කෑම කෑමට නොහැකි වීම නිසා මා රෑ කෑම කෑවෙමි.එනමුදු ඒව පෙර කෑ රාජ බොජුන් ලෙස නොතිබුනොත් අම්මාගේ කීම නිසා මා රෑ කෑම ගත්තෙමි.

ගෙයි පිල මත වාඩිවී සිටි අප්පච්චි මා හට ලඟට කතා කළේ ය. මම ඔහු ළඟට ගොස් හිටගෙන සිටියෙමි. ඉන්පසු ඔහු මා හට ඉඳගන්න ලෙස සංඥා කළේ ය. ඔහු ළඟින් වාඩි වූ පසු ඔහු මගෙන් ''උඹට අර ගමන යන්නම ඕනෙද?'' යැයි ඇසුවේය

තාත්තා මගෙන් අසන්නේ චාරිකාව පිළිබඳ මා දැනසිටි බැවින් සහ චාරිකාව පිළිබඳ බලා බලාපොරොත්තු ඒ වන විට අත්හැර තිබූ

නිසා “නැහැ අප්පච්චි ” යයි කීවෙමි. එහෙත් මාගේ සිත තුළ චාරිකාව යෑමට ආසාවක් නොතිබුණා ම නොවේ.

අප්පච්චි එයට පිළිතුරු දීමට අපොහොසත් වූ බැවින් විනාඩි දෙක තුනකට පමණ පසු මම එතනින් ගොස් මල්ලි සහ නංගී සමග සතුටින් කතා කළෙමි. ඒ මට ඔවුන්ට කතා කිරීමට ඇති ආශාව නිසා නොව තාත්තා මාගේ සිත රිදුනා යැයි සිතන නිසාවෙනි.

# 6

ඊළඟ දින කීපය සාමාන්‍ය ලෙස ගෙවුනේ ය. ඒ අතරතුර පාසලට අලුතෙන් ළමයෙක් පැමිණියේ ය. ඔහු නමින් සනත් විය. සනත් ද චාමර මෙන් හොඳ යහළුවෙක් විය. ඔහුගේ පියා පොලිස් නිලධාරියෙක් වූයේය. ඔහු පැමිණ දවස් තුනකට පමණ පසු මා හට අසන්න ලැබුණු පුවතෙන් මට සිතුනේ මීට අවුරුදු හතරකට පමණ පෙර මා ශිෂ්‍යත්ව විභාගය ලියන විට මා හට ලැබුණු වාසනාව නැවත පැමිණ ඇතැයි කියා. එම පුවත ඇසීමෙන් මටත් වඩා සතුටු උනේ චාමරයි.

පාසල ඇරී නිවෙස වෙත ගිය ගමන් මම අම්මාට ආරංචියි කියා සිටියෙමි.

“ අම්මේ මේ අහන්නකෝ... මැඩම් කිව්වා ඉන්අනිද්දට තියන ඉස්කෝලේ ගමන යන්න ළමයි තුන් දෙනෙක් විතරක් මුළු පන්තියෙන් ම ලියුමයි සල්ලි ගෙනත් දුන්නේ නැති නිසා එයාලා තුන්දෙනාගෙන් පවුලේ අය චාරිකාව යවන්න කැමතියි ඒත් සල්ලි ප්‍රශ්නයක් තියෙන ළමයි ඉන්නවානම්  මැඩම්ට කතා කරන්න කියලා එහෙම කතා කළොත් මැඩම් ගමන යන්න හදලා දෙන්නං කියලා” අම්මා මා දෙස බලා සිනාසී

“එහෙනම් අප්පච්චිට කියන්න හෙට මැඩම්ව හම්බෙන්න යන්න කියලා” යැයි පැවසුවා ය.

“අනේ අම්මේ අප්පච්චිට ඔයා කියන්නකො”

“හා හා මම කියන්නම්  දැන් ගිහින් මූණ කට පිහදාගෙන බත් කාපන්”

මා කුස්සියට යන අතරමග අක්කා විසින් අම්මාට

“දැන් ඉතින් කනක් ඇහිලා ඉන්න වෙන්නේ ගිහිල්ලා ආපු දවසෙ ඉඳන් කියවයි” කිවුවාය.

අම්මා එයට පිළිතුරු ලෙස දුන්නේ කුමක්දැයි මට නොඇසුණි. මම බත් කා  මූණ කට සෝදා පාඩම් කිරීම ආරම්භ කළෙමි .

ටික  වේලාවකට පසුව අප්පච්චි ගෙදර පැමිණියේය. අම්මා විසින් ඔහුට තේ පිළියෙල කර දුන්නාය. ඉන්පසු මාගේ ශරීරය පමණක් මේසය අසල තිබූ අතර මගේ හිත කුස්සියේ සිටි අම්මා අප්පච්චි වෙත ඇදී ගියේය. අම්මා අප්පච්චිට විස්තරය කිව්වා ය.

ඉන්පසු අප්පච්චි එය නිහඬව අසා සිටීමෙන් මට හැඟුනේ ඔහු ඇත්තටම මැඩම්ව හමුවීමට එතරම් කැමති නොවූ බවයි ඇතැම් විට

ඔහුගේ සිතේ ඇත්තේ එය ඔහුට මදිපාඩුවක් යැයි කියා හෝ මැඩම් සමග කතා කිරීමට ඇති බියයි.

කෙසේ වෙතත් ඊළඟ දිනයේ අප්පච්චි මා සමඟ පාසලට ගොස් මැඩම්ව හමුවුණේය. මම මැඩම් පෙන්නා පන්ති කාමරයට ගියෙමි. ඉන්පසු මම ගෙදර ගොස් අම්මගෙන් විස්තර ඇසුවෙමි. එවිට අම්මා කිව්වේ අප්පච්චි මැඩම්ට කියා ගමන යෑමට අවසර ගත් බවයි.අම්මා එය කීමෙන් පසු මා ජීවත් වූයේ හෙටත් පස්සේ දවසේ ය.

ඊළඟ දිනයේ පාසලේ දී අපට පැමිණිය යුතු වේලාව රැගෙන ආ යුතු දේවල් වැනි විස්තර මැඩම් විසින් කිව්වා ය. ගෙදර විත් මේ සියල්ල අම්මාට අකුරක්වත් නෑර කීමට මම වග බලා ගත්තෙමි.

මාගේ සතුට ට ප්‍රධාන හේතුව වූයේ මා මතක හැටි කාලෙක සිට මෙවැනි දුර ගමනක් ගොස් නැති වීමයි . එනිසා මෙය මට ලොකු අත්දැකීමකි. මේ ගමන විශේෂ වන්නේ අපගේ ප්‍රධාන නැරඹුම් ස්ථානය දූපත්ක් වීමයි. මීට පෙර මා කිසිදාක දූපතක් දැක නැත එනිසා මේ මට බොහෝ සෙයින් විශේෂ වේ.

නිදා ගැනීමට පෙර මා අම්මා හට

“අම්මේ පරක්කු නොවී හෙට හරියටම වෙලාවට ඇහැර වන්න නැත්නම් මාව දාලා යයි” යැයි දෙසරයක් කිව්වෙමි.

“හා හා උඹ නිදා නිදාගනින් කෝදැම්ම නිදාගත්තොත් හෙට උදේම ඇහැරේ වි” අම්මා මා හට සිනහාමුසු මුහුණෙන් පැවසුවේ ඇය මා හට මානසික ලෙඩක් ඇත්දැයි සිතමින් ද නොදනිමි.

මා නිදා ගැනීමට සූදානම් වුවත් නින්ද නොයයි.

# 7

ඊළඟ දිනයේ චාරිකාව යෙදී තිබූ නිසා මා උදෑසන ම නැගිට මූණ කට සෝදා හොඳින් පිරිසිදු කර තිබූ නිල ඇඳුම් හා සපත්තු දෙක දමා බෑගය සූදානම් කර ගත්තෙමි.

මම එයට මැඩම් කිවූ ආකාරයට අම්මා මෙවැනි හදිසි හා විශේෂ අවස්ථාවල භාවිතයට තිබූ ඇඳුම අමතර ඇඳුමක් ලෙස ගෙන එය ද තව අවශ්‍ය බඩු භාණ්ඩ ද ගෙන බෑගයට දමා ගත්තෙමි.

චාරිකාව යෑම සඳහා අම්මා මා හට පාන් සම්බෝල සමග සකසා තිබුණනාය .මේසේ උඩ තබා තිබූ එය ද බෑගයට දමාගත් මම අම්මා ට වැන්දෙමි.

එවිට අම්මා මා දෙස බලා"මැඩම් එක්කම ගමන ගිහින් පරිස්සමින් වරෙන් "යනුවෙන් උපදෙස් මාලාවක් දුන් අතර මම එයට සවන් දුන්නෙමි.

ඉන්පසු අප්පච්චී සමඟ මා චාරිකාව යෑමට බස් රථය නවත්වා තිබූ ස්ථානයට ගොස් අප්පච්චිට වැඳ යන්නට සැරසුනි.

එවිට ඔහු මා හට "පරිස්සමින් ගිහින් වරෙන් මේ සල්ලිවලින් මොනාහරි ගනින්" යැයි කියා මා හට සල්ලි දුන්නේ ය.

එයද රැගෙන මා බස් රථයට නැග අවට චාමර සිටින්නේ දැයි පරික්ෂා කළෙමි. ඔහු පාසලට පරක්කු වී පැමිණියත් මෙවැනි දිනවල ඔහු කාටත් ප්‍රථමව පැමිණ සිටින්නේ ය.

ඔහු මා හට ජනේලය ළඟ ආසනයක් පිරිනැමුවේ යන අතරමග ඔහුට නැගී සිට දැගලීමට පහසු වන  නිසාය. අපගේ  බස් රථයේ පන්ති භාර ගුරුතුමිය වන චමිලා මැඩම් හා ගණිතය උගන්වන වන අමිල සර් සිටියෝය.

 ගමන  ආරම්භ කර පැය දෙකක පමණ ගමනකින් පසු බස් රථය නවාතැන්පළක නවත්වා මැඩම් විසින් අපට උදේ ආහාරය ගන්නා ලෙස  කීවාය.  අපි සියල්ල ඉන් පසු බස් රථයෙන් බැස එකිනෙකා ගෙන ආ ආහර මාරුකර කර ගනිමින් උදේ ආහාරය ලබා ගත්තෙමු.

 එම ස්ථානයේ විනාඩි තිහක පමණ වේලාවක් රැදී සිටීමෙන් පසුව අපි සියලු දෙනා ම තම තමන්ගේ වෙනත්අවශ්‍යතා ඉටු කර ගැනීමෙන් පසු නැවත බස් රථයට නැග ගමන ආරම්භ කළෙමු. ඉර මුදුන් වී තිබූ නිසා සියලු දෙනාගේ ම අලස ගතිය මිදී ගොස් තිබුණි.

 එනිසා අමිල සර් විසින් අපව ප්‍රබෝධවත් කිරීම සඳහා ගීතයක් ගායන් කළේය.ඉන් පසු අපි සියලුම දෙනා එක් ව තාලයට ලස්සනට සින්දු කීම  ආරම්භ කලෙමු.  චාමර ද ඉතා හයියෙන් සින්දු කිය කියා නැටුවේ ය.ඔහු මට ද ආරාධනා කළ නමුත් මම ඔහු සමග සින්දු කීමට පමණක් ගියෙමි.

සියලු දෙනා සින්දු  කීමෙන් විඩාවට පත් වී සිටියත් ඔවුන් එය නොනවත්වා ම ගමනාන්තය දක්වා ම එකා දෙන්නා හෝ සින්දු කියමින්  ගියෝය.මම ඉතා කලාතුරකින් මෙවැනි ගමනක් යන නිසා බස් රථයේ ජනේලයෙන්  පිටතින් රටේ සංවධර්නය බලා සිටියෙමි.

බස් රථය ගමනාන්තයට ළඟා වුණි.සියලු දෙනාම ඉතාමත් කැමැත්තෙන් බස් රථයෙන් බැස්සේ මෙතෙක් වෙලා බස් රථයේ හිඳ සිට තමාගේ ශරීර වෙහෙසට පත් වී තිබූ නිසාය.

අප සියලු දෙනාම බසයෙන් බැසීමෙන් අනතුරුව පන්ති භාර ගුරුතුමිය විසින් අපව පේළියට සකසා මුහුදු වෙරළට එක්කං ගියාය.අපි ඉස්සෙල්ලා ම මුහුදු දැක එහි සෙල්ලම් කළෙමු.

මගේ ජීවිතයේ මෙය මුහුද දැක ඇති දෙවන වරයි.නංගී මල්ලී සිටියා නම් හොඳයි සිතුනේ ඔවුන් කිසි දිනෙක මුහුද දැක නැති නිසාය. එහෙත් මම අප්පච්චී සමඟ වැඩකට කොළඹ පැමිණි වෙලාවේ මුහුදට පැමිණ පැය දෙකක් පමණ සිටියෙමු.

අපි මුහුදේ සෙල්ලම් කරන අතරතුර මැඩම් අප දෙස බලා සිටි අතර සර් දූපතට යෑමට අවශ්‍ය බෝට්ටු සහ අනෙකුත් පිරිස් රැගෙන ඒමට ගියේය.

ඒ අතරතුර මැඩම විසින් අපට “ළමයි හැමෝම අහගන්න අපි යන්නේ දූපතකට ඒ නිසා එහෙ බොන්න පුළුවන් වතුර නෑ ඔයාලගේ වතුර බෝතල් ඉවරයි නම් ගිහිල්ලා අන්න අතන තියෙන කරාමයෙන් වතුර පුරවා ගන්න ” යැයි කියා අපට ඇගේ අත දිගු කර කරාමයක් පෙන්නුවා ය. අපි වතුර බෝතල් රැගෙන ගොස් වතුර පුරවා ගත්තෙමු.

සර් විනාඩි හතළිස් පහකට පමණ පසුව බෝට්ටු හා අනෙකුත් සියල්ල සකසා අප ව වෙන්කර බෝට්ටුවලට නංවා අපට අංකය බැගින් දුන්නේය.

අපි පස් දෙනෙකු එක බෝට්ටුවක ගමන් කළෙමු. මම මගේ ජීවිතේ පළමු වතාවට බෝට්ටුවක මුහුදේ ගමන් කළෙමි. එය විනෝද කාමී අත්දැකීමකි.අපි විසින් ආරක්ෂිත ඇඳුම් ඇද ගමන් කළෙමු.

විනාඩි හතළිස් පහක් පමණ ගමනකින් පසුව අපි දූපතට ගියෙමු. අපි ව එහිදී කණ්ඩායම් වශයෙන් වෙන් කරන ලදී.එක් කණ්ඩායමකට ළමුන් පස් දෙනා බැගින් අයත් වූයේ ය.

මගේ කණ්ඩායමේ මම,චාමර,සනත්,සරත්, සමීර සිටියෝය.අද දවසේ මාගේ ජීවිතයේ කොටසක් නොවේ යැයි සිතුන වාර ගණන අනන්තයකි. කෙසේ වෙතත් බෝට්ටුවෙන් බැස ආරක්ෂිත ඇඳුම් ගලවා බෝට්ටුවට දමා අපි මැඩම් පසු පස ගියෙමු.

මඳක් දුර යන විට ගුරුතුමිය විසින් අපට විශාල දේශනාවක් කළාය.

"ළමයි ඔයාලා මාත් එක්කම එන්න තම තමන්ගේ කණ්ඩායම් වල ඉන්න අය හැම වෙලාවෙම එයාලගේ යාලුවෝ ඉන්නවද කියල බලන්න මේ දූපත ගැන තාම පරීක්ෂණ කරලා ඉවර නැහැ .ඒක නිසා ඔයාලා මං යන පාරෙ ම එන්න ඕන. හරි එහෙනම් අපි දැන් ඉස්සරහට යමු කාටහරි ප්‍රශ්නයක් තියෙනවනම් දැන් අහන්න."

කිසි අයෙකුට කිසිම ප්‍රශ්නයක් තුබූ නේ නැත එනිසා මැඩම්

"එහෙනම් කාටවත් ප්‍රශ්න නැනේ අපි යමු ඉස්සරහට"කියා ගමන නැවත ආරම්භ කළාය.

මඳක් දුර යන විට අප කණ්ඩායමේ සිටි සමීර විසින් යෝජනාවක් ඉදිරිපත් කළේය.

එය නම් "මැඩම් මේ දූපත ගැන එච්චර දන්නෑ. මේක විශාල දූපතක් වුනත් මේකේ එහෙම දරුණු සත්තු නෑ.මම අපේ අම්මයි

තාත්තයි එක්ක මීට කලින් මේ දූපතට දෙසරයක් ඇවිල්ල තියෙනවා .මම දන්නවා මේ පාරේ ගියොත් ලස්සන දේවල් බලන්න වෙන්න නෑ හැබැයි මං දන්නවා පාරක් ඒකෙන් යමු එතකොට අපිට ලස්සන අරුම පුදුම විශාල ගහක් බලන්න පුළුවන් "

" සමීර මැඩම් කිව්වනේ මේ දූපතේ පරීක්ෂණ තවම කරල ඉවර නෑ කියලා. ඒක නිසා අපි හරියටම දන්නැනෙ මේ දූපත මොන වගේ එකක්ද කියලා. ඒක නිසා අපි මැඩම් එක්කම යමු" යැයි කියා සනත් කීවේය.

එවිටම සමීර ඔහු වෙත කඩා පැන

"අයියෝ සනත් අපේ නංගිවත් ඔච්චර බය නෑ. බයවෙන්න එපා මේ පාරයි ඒ පාරයි එක සමාන දුරකින් තියෙන නිසා අපිට මැඩම් ලා එක්කම යන්න පුළුවන් "

"ඒත් සමීර මමත් කැමති නෑ ඔය වැඩේට. අපේ අම්මා නම් කිව්වේ මැඩම් එක්කම ගිහිල්ලා පරිස්සමින් ගෙදර එන්න කියලා" යැයි මා පවසන විට සමීර මා වෙත අත දිගු කර පාරවල් දෙකක් පෙන්වා මෙසේ කිව්වේ ය.

" අපි මැඩම් යන පාර ගියත් මං කියන පාර ගියත් පරිස්සමින් අපිටත් එකම වෙලාවක යන්න පුළුවන්.ඒ උනාට මං කියන පාරේ ගියොත් හරි අමුතු මුල හීනි අග මහත ගහක් බලන්න පුළුවන්"

" හරි හරි මෙයා කිව්ව හින්දා අපි ගිහිල්ලා බලමු. අපි ඒ ගහේ පින්තූරයක් මේ කැමරාවෙන් ගමු. ඊට පස්සේ මුළු පන්තියට ම විස්තර කියමු. ඔයාලා පොඩ්ඩක් හිතන්නකෝ පන්තියේ ඔක්කොම ළමයි එක චාරිකාවක් ගිහිල්ලා අපි පස් දෙනා විතරක් අරුම පුදුම

දෙයක් දැක්කහම" යැයි එයට උල්පන්දම් දී සමීරගේ යාළුවා වන සරත් ඔහු අත තිබූ කැමරාව පෙන්වා අපට කිව්වේය.

" ඒ අදහස නම් හොඳයි අනේ මන්දන්නෑ මට නම් තේරෙන්නෙ නෑ " යැයි චමීර කියා සිටියේය.

" හරි හරි බයවෙන්න එපා අතරමං උනත් අතරමං වෙන්නේ පස්දෙනාම නේ හදිසියෙවත් අපි අතරමං වුනොත් අපි එකතුවෙලා මේ දූපතේ අලුත් රටක් හදමු." එය සරත් කියන විට අපි පස් දෙනාම සිනාසුනෙමු.

" හරි හරි හිනා වෙන්න වෙලාවක් නෑ අපි යමු මැඩම් එන වෙලාවට අපි එතනට යන්න එපෑ" යැයි සමීර කිව්වේය.

මේ සියල්ල මැඩම් පසුපසින් යන ගමන් කතා කළ අපි හිමින් සීරුවෙ අනිත් ළමයිට නොදැනී ම ඔවුන්ගෙන් වෙන් වුනෙමු. ඒ මොහොතේ එසේ කළේ මා ම දැයි මට සිතුනේ මා ඉතා අහිංසක ළමයෙක් වුණ බැවිනි.

අප හතර දෙනා සමීරගේ මගපෙන්වීම ඇතිව වෙනත් මාගර්යක ගමන් කළෙමු. ටික දුරක් යන තෙක් කිසිවෙක් සද්ද නොකළේ සියලු දෙනාගේ ම සමීරට හැර සිත් තුළ බියක් තිබුණු නිසාය. විනාඩි තුනකට පමණ පසුව

"මොකද සද්දයක් වත් නැත්තේ ඔයාල බය වෙලාද?" යැයි කියා සමීර හඬ අවදි කළේය.

"බය නොවී ඉන්න බැනේ සමීර අපි කරපු වැඩේට" යැයි මා විසින් ඔහුට කීවේ පෙර විනාඩි තුනක පමණ කාලයේ මාගේ සිතේ අම්මා අප්පච්චි මා හට ඒමට පෙර දුන් අවවාද එහෙ මෙහෙ අත දිවූ බැවිනි.

“ ඔයාලා බයවෙන්න එපා සමහරවිට මග දී අපට මැඩම්ලා හම්බෙන්නත් පුළුවන්” යැයි සමීර කිසිදු බයකින් තොරව කිව්වේය.

“ දැන් ඉතින් හම්බුනත් නැතත් යන්න එපෑ ආයෙ ගියොත් අනිවායෙර්න් ම අපි අතරමං වෙනවා” මෙතෙක් නිහඬව සිටි චමීර කිව්වේ ය .

ඉන්පසු අපි කතාබහකින් තොරව ගමන් කළෙමු. විනාඩි දහයක් පමණ අපි එක දිගට ගමන් කළෙමු. මං එහි ගමන් කරද්දී මා හට දැනුනේ මා දූපතක නොව බාගෙට එළි කරන ලද වනාන්තරයක ඇවිදිනවා මෙන් හැඟීමකි.

ටික දුරක් යන විට මේ බලන්නකො මේ ලස්සන මල දිහා යැයි චාමර කෑගැසුවේ උඩ ගසක ගොස් තිබූ වැලක පිහිටා තිබූ ලස්සන මලක් වෙත අත දිගු කරමිනි.

“හ්ම්ම්... ඒක හරි ලස්සනයි. අපි පින්තූරයක් ගමු” ඇයි සරත් කිව්වේය.

“එපා එපා ඉන්න මම ඒක බිමට ගන්නකං” සමීර හඬනගා කියා එසැනින් ගලක් අතට ගෙන එයට පහර දීමට සැරසුනි.

“එපා එපා ඒක ගහේ තියෙද්දී තවත් ලස්සනයි අනික අපිට වෙලා යනවනෙ අපි යමු” යැයි සනත් කීවේය.

“හරි හරි ඉන්නකෝ” ලෙස සමීර ගත් කටටම කියා අතට ගත් ගල ගෙන මලට ගැසුවේය.

ඉන් තත්පරයක් යැමටත් පසු මා හට මේ ජීවිතයේ අමුතුම හා ත්‍රාසජනක ම අත්දැකීම ලබාගැනීමට හා ජීවිතයේ බියකරුම අවස්ථාවට මුහුණ දීමට සිදු වුණි.

ඒ මොහොතේ මාගේ සිත තුළ ඇති වූ හැඟීම් ලිව හෝ ප්‍රකාශ කළ නොහැක.

සමීර මල වෙත ගල ගසන විට ම එහි අත්තක සිටි සතෙකුගෙන් ඇති වූ ශබ්දය මේ සියල්ලට ම හේතු විය. එම ශබ්දය මුළු දූපත පුරා ම විසිරී ගියේය. එම ශබ්දය තවමත් මාගේ හද තුළ දෙදුරුම් කයි.

# 8

එය ඇසූ පමණින් චාමර, මම, සනත් එක් දිශාවකට අපට ඉදිරියෙන් ගමන් කළ සමීර හා සරත් තව දිශාවකටත් දිව ගොස් තිබුණි.

අපගේ වාසනාවට මෙන් කුඩා ගුහාවක් දැකගත හැකි විය. එය නම් අපගේ ම වාසනාවකි. අපි දුව ගොස් සැඟවුනෙමු.

ඉන් විනාඩි තුනකට පමණ පසු අපි තිදෙනා එකිනෙකා දිහා භීතියෙන් බලා සිටියෙමු.

“අනේ මම ඒ වගේ බය හිතන සද්දයක් ජීවිතේ ට අහලා නෑ මට නම් බයයි” සමීර කලබලයෙන් කීවේය.

“අනේ අපිට මෙහෙට වෙලා ඉන්න බෑ නේ අපි මොකද කරන්නේ යැයි” මා කියූ සැනින්

චමීර “අපි එළියට යන්නේ කොහොමද අර සතා අපිට අනතුරක් කරයි” යැයි කිව්වේ ය.

“මම හිතන්නේ අපි තව ටිකක් මෙතන ඉඳලා ගියා නම් හොඳයි ඒ සතා අපිට කරදරයක් කරන්න ගියේ අපි උගට කරදරයක් කරපු

නිසා නේ අපි එච්චර වෙලා හිටියා අපිට කිසි කරදරයක් කළේ නෑ අපිට මෙතන වෙලා ඉන්න බැනෙ අපි තව ටිකකින් යමු.”

“ඔව් සමහරවිට මැඩමුත් දැන් කලබල වෙලා අපිව හොයනවා ඇති. හරි කමක් නෑ අපි තව ටිකක් නිශ්ශබ්ද ව ඉමු. මේ ගුහාවේ මොකුන් හරි ඉන්නවද දන්නෑ.” යැයි චමීර කිව්වේ ය.

ඉන්පසු මා මෙතෙක් අඬනවා දැක නොතිබූ සනත් “අනේ අපිට මැඩම් ලා එක්කම ඉන්නයි තිබුනේ” යැයි කියමින් හැඬීමට පටන් ගත්තේය.

ඉන්පසු මා නැගිට “දැන් වෙච්ච දේ වෙලා ඉවරයි ඒක නිසා අපි මැඩම්ව තව ටිකකින් හොයමු.”

“අනේ ඔව්.... ඔයා අඬන්න එපා අපි ඉන්නවා නේ අනික මගේ ළඟ තවත් කෑමයි වතුරයි තියෙනවා අපි ටිකක් වෙලා මෙතන ඉදලා හෙමින් සැරේ යමු” යයි කියූ චමීර සනත් සැනසුනේ ය.

ඉන් විනාඩි විසි පහකට පමණ පසුව අපි හිමින් සැරේ ගුහාවෙන් එළියට ආවෙමු.

ඉන්පසු අපි අනෙක් ළමයි සොයා හිමින් ගමන් කළ ද අනෙක් ළමයි අපට මුණ නොගැසුණි.

“ අනේ අපරාදේ අපිට මැඩම්ලා එක්ක යන්න තිබුනෙ. සමහරවිට සරත්, සමීර මැඩම්ලා ළඟට යන්න ඇති” යැයි මම දුක්මුසු මුහුණින් පැවසුවෙමි.

“හ්ම්ම්... අන්තිමේදි අපි තුන්දෙනා විතරයි ඉතුරු වුණේ. සමහරවිට අපිට සමීරයි සරතුයි හොයාගන්න පුළුවන් වෙයි ඒක නිසා අපි

ටිකක් තව දුර ගිහිල්ලා බලමු" යැයි කියූ චමීර නැවත ගමන ආරම්භ කළේය.

“ අනේ අපි දැන් මේ ගමන නවත්තමු. මට නම් හරි ම මහන්සියි අපි දැන් මොකද කරන්නේ" යැයි මෙතෙක් නිහඬව සිටි සනත් කියා ලඟ තිබු ගසක කොටයක් මත ඉඳගත්තේ ය.

“ අපිට මෙහෙම ඉන්න බෑ කොහොමත් අද රෑට මෙහෙ තමයි ඉන්න වෙන්නේ. අපිට කිසි එළියකුත් නෑනේ හ්ම්ම්... අපි ඉක්මනට කොහේ හරි තැනක් හොයාගමු නිදාගන්න. මට හරි නිදිමතයි අද උදේම නැගිටපු නිසා " මම ඉතා වෙහෙසට පත්ව සිටි බැවින් කියා සිටියෙමි.

“ ඔව් ඔව් ඒක හොඳයි අපි ඉක්මනට තැනක් හොයාගෙන එතන හදාගමු දැන් ඉතිං අපිට එච්චරයි කරන්න තියෙන්නෙ" යැයි සනත් නැගී සිට කිව්වේ ය.

“ එහෙනම් අපි ඉස්සෙල්ලා ම ලී ටිකකුයි මේ පොල් ගස් වලින් අතු ටිකකුයි තව.. ඒවා එකට තියලා බඳින්න හොඳ ලණු වගර්යකුයි ඉක්මනට හොයාගමු " යැයි කියූ මම වැඩ ආරම්භ කළෙමි.

අප තිදෙනා එක් ව දූපතේ සෑම තැනම වැවී තිබූ පොල් ගස්වලින් අතු ගෙන ඒවා ගොඩක් සාදා ගත්තෙමු.එය අපට ඉතා බැරෑරුම් කායර්යක් නොවුනේ දූපතේ සෑම තැන ම අතු බිමට වැටී තිබූ නිසාය.ඉන්පසු අපි තිදෙනා ලී සෙවීමට ගියෙමු.

“ අපි කොහොමත් මේ කැලේ ඇතුලට යන්න ඕනි නෑ. මේ වටේ තියෙන ගස් වලින් ම ලී ගමු. මේ කැලේ ඇතුලෙ තව මොන සත්තු ඉන්නවද දන්නේ නෑ නේ "යැයි සනත් කිව්වේය.

“හ්ම්ම්... ඔව් අපිට රෑට ඉන්න හොඳට වට කරපු කූඩාරමක් වගේ දෙයක් හදාගන්න තිබුනා නම් හරි ”

“ අපි බලමු. නැත්නම් අපි මාරුවෙන් මාරුව නිදාගමු ”

“ ඔව් ඔව් ඒක හොඳයි ”

ඉන්පසු අප තිදෙනා විසින් ලී කෝටු කිහිපයක් ගෙන ආවෙමු. ඒවා එක උස වුවත් ඒවා සියල්ල ඉතා උස බැවින් අපිට කූඩාරම සාදාගත හැකි වේ යැයි අපි අනුමාන කළෙමු.

ඉන්පසු අපට ගැටලුව වූයේ මේ දූපතේ කොයින්ද පොල් අතු යි ලී එකට තබා ගැට ගැසීමට අවශ්‍ය ලණු සොයාගන්නේ යන ගැටළුව මතු වුණි.

ඉන්පසු අපි විසින් දූපතේ විවිධ ස්ථාන වල තිබූ ලණු ලෙස යොදා ගත හැකි විවිධ ගස් වටා එතී තිබූ වැල් වැනි දේ එකතු කරන ලදී.

මේ සියල්ල එකතු කර ගැනීමට අපට පැයකට ආසන්න කාලයක් ගත වුණි.ඉන්පසු අප තිදෙනා එක්වී අප එකතු කර ගන්නා ලද සියල්ලෙන් ම තාවකාලික කූඩාරමක් සාදාගතිමු. අප සිතුවාට වඩා ඇත්තෙන් ම එය හොඳ කූඩාරමක් වුණි.

ඉන්පසු මා ජීවිතයේ මෙතෙක් දැක ඇති ලස්සනම දසුන වන ඉර බැසයාම දූපතේ සිට දැක ගත්තෙමි. එහි අලංකාරය කියා නිම කල නොහැක.

ඉන්පසු අප නිදා ගත්තේ අඳුර වැඩි වුවහොත් අපට කිසිදු ආලෝකයක් නොතිබුණු බැවිනි.අපි වරින් වර එකිනෙකා බැගින් මුර කළෙමු. දෙදෙනෙක් නිදාගන්නා විට එක් අයෙක් මුර කළේය. චමීර ගිය ඔරලෝසු භාවිතා කළ අපි වෙලාව මැන ගත්තෙමු.

පළමුව මා ද දෙවනුව චමීර ද තෙවනුව සනත් මාරුවෙන් මාරුවට මුර කළෙමු.

උදෑසන නැගිට බලන විට මම මෙතෙක් ජීවත් වූ සිහිනෙන් නැඟිට යථා තත්ත්වයට ආවා මෙන් දැනුණි.කෙසේ වෙතත් මෙතෙක් මා සිත තුළ තිබූ සියලුම බිය ත්‍රාසය කුතුහලය කියන සියල්ල මැකී ගොස් තිබුණේ අපව සොයාගෙන අපි උදෑසන නැගිටින විට අප ඉදිරියෙන් නිල ඇඳුම් ඇඳගත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් සිටි බැවිනි.

කෙසේ වෙතත් මා උදෑසන නැගිටින විට අනිත් දෙදෙනාම නිදා සිටියෝය. මම පළමුව නැඟිට අනිත් දෙදෙනාටත් කතා කළෙමි. ඔවුන් ඉක්මනින් නැගිට මං කියූ දෙයට සවන් දුන්නෝ ය.

“ චමීර චමීර.. සනත් සනත්... නැගිටින්නකෝ නැගිටින්නකෝ අපි බේරුණා”යැයි මා ඔවුන් අවදි කළෙමි.

එක්වරම චමීර “ඇයි ඇයි මොකද වෙලා තියෙන්නෙ ප්‍රශ්නයක්ද?” කලබලයෙන් කිව්වේය.

මම ඔවුන්ට කරුණු පහදා දුන්නෙමි.ඉන්පසු අපි තිදෙනා මුහුදු වතුරෙන් මුහුණ සෝදා පොලිස් නිලධාරීන් වෙත ගියෙමු.

ඔවුන් අපට මද සිනාවක් පා එතැන සිටි එක් පොලිස් නිලධාරියෙක් විසින්.

“ ආ කට්ටිය.. ඊයෙ වික්‍රමයක් කරා නේ හොඳට නින්ද ගියාද?” යනුවෙන් අපෙන් අසා සිටියේය.

අප එයට පිළිතුරු නොදී මද සිනාවක් පෑවෙමු.

“ ආ හරි හරි කමක් නෑ ලස්සන ගෙදරකුත් හදලා තියෙන්නෙ. දැන් බඩගිනි ඇති නෙ අන්න අතන අර පෙට්ටියෙ බනිස් ඇති ගිහිල්ලා කන්න” යැයි තවත් පොලිස් නිලධාරියෙක් විසින් කියා ඔහු අපට අත දික් කර කුඩා පෙට්ටියක් පෙන්නුවේය.

අපි ගොස් එම පෙට්ටියෙන් බනිස් ගෙන කැවෙමු.ඉන්පසු අපි එතන තිබූ වතුර බෝතලයක් ගෙන එයින් වතුර බිව්වෙමු.

“ ආ ඇති නේද දැන් නිවාඩුව ගත කලා. තුන්දෙනාම එකතු වෙලා ගිහිල්ලා අන්න අර බෝට්ටුවට නැගලා ආරක්ෂිත ඇඳුම් ඇඳගන්න” අප සමග කලින් කතා කර එක් පොලිස් නිලධාරියෙක් විසින් පැවසුවේය.

අපි ඔහු කියූ පරිදි බෝට්ටුවට නැග ආරක්ෂිත ඇඳුම් ඇඳගත්තෙමු. ඉන් පසුව අපි යන අතරතුර ඔහු අපගෙන් ප්‍රශ්න ඇසුවේය. ඒවාට බොහෝ දුරට චමීර විසින් පිළිතුරු දුන්නේය. සරත් සහ මම එකකට හෝ දෙකකට පිළිතුරු දුන්නෙමු.

අපි ගොඩබිමට එනවාත් සමග ම අපව පිළිගැනීමට මැඩම් සහ සර් පැමිණියෝය.ඔවුන් අපගෙන් විශාල ප්‍රශ්න රැසක් ඇසුවෝය. ඇතැම් විට ඔවුන් අපට බැණ වැදුණෝ ය.

ඉන්පසු අප සියලු දෙනාම බසයකින් නැවත ගම බලා පැමිණියෙමු. අපි පාසලට පැමිණෙන විට දහවල් දෙක පමණ වී තිබුණි.

මැඩම් විසින් චාමරගේ අප්පච්චිට දුරකථනයෙන් අමතා අපව රැගෙන යාමට එන ලෙස දැන් වූයේය.

ඔහු ඔහුගේ ලොරියෙන් අපව රැගෙන යාමට පැමිණියේ ය. ඔහු අප වෙත ආදරණීය බැල්මකින් බැලුවද ඔහු අපගේ මුරණ්ඩු කම ගැන ගෙදර යන ගමන් අපට බැන්නේය.

අප දෙදෙනා නිහඬව ගමන් කළේ එහි අපගේ ද වැරැද්දක් ඇති බැවිනි. ඉන්පසු මම චාමර ගෙන් හා ඔහුගේ අප්පච්චීගෙන් සමුගෙන ගෙදර ගියෙමි.

මා ගෙදර ගිය විට අම්මා මා බදාගෙන හඬන්නට වූණි. එහෙයින් මාගේ හදවත පිච්චුනා මෙන් මා හට දැනුනි.

අප්පච්චි මා හට "ආ මේ ඇවිත් ඉන්නේ වීර පුරන් අප්පු" මා දෙස බලා මද සිනාවක් සමග කිව්වේය.

මෙතෙක් හඬමින් සිටි අම්මා ද ඇයගේ කඳුළු පිස දමා මා හට බැනීමට පටන් ගත්තා ය. ඒ සියල්ලට ම සවන් දුන් මම ගෙතුලට ගියෙමි. නංගි සහ මල්ලි මා දෙස අමුතු ජීවියෙක් දෙස බලන්නා වූ බැල්මකින් බලා සිටියෝය.

මම ඉන්පසු අම්මට කියා ඇළට ගොස් හොඳින් නා ගත්තෙමි. මා නැවත ගෙදර එන විට අම්මා විසින් මා හට බත් බෙදා තිබුණි. මම එය කන ගමන් අම්මා ඇසූ දහසක් ප්‍රශ්න වලට පිළිතුරු බැන්දෙමි. මා අම්මට ඇතැම් දේ පවසන විට ඇය මඳ සිනාවක් පෑවාය.

ඉන් පස්සෙ හෙමින් හෙමින් සවස් කාලය පැමිණීමත් සමඟ රෑ ආහාරය ගෙන මම නින්දට ගියෙමි. මා නින්දට යන විට මාගේ සිතේ පෙර දිනයේ සිදු වූ සියල්ල මැවී මැවී පෙණුනේය.

ඉන්පසු උදෑසන සුපුරුදු පරිදි පාසලට ගිය මා අනෙකුත් ළමයින් සමඟ මගේ අත්දැකීම් බෙදා ගත්තෙමි. ඔවුන් මා වෙත ඔවුන්ගේ

දෑස් යොමු කර පුදුමයෙන් බලා සිටියෝය. මම චිත්‍රපටයක සිටින වීරවරයෙක් මෙන් සියල්ල ඔවුන්ට පැහැදිලි කර දුන්නෙමි.

මා මේ සියල්ල අනෙක් ළමයිට පැහැදිලි කරන අතරේ සමීර පැත්තකට වී අප දෙස බලා සිටියේය. ඉන්පසු මම අනෙක් ළමයින් ගෙන් මිදී ඔහු වෙත ගොස් ඔහු හා කතා කළෙමි.

"ඇයි සමීර අපිත් එක්ක තරහ වෙලා ද කතා කරන්නේ නැත්තේ" මම ඔහුගෙන් අසා සිටියෙමි.

"අනේ නැහැ ගයාන් මම ඇයි ඔයාලත් එක්ක තරහ වෙන්නේ ඔයාලනෙ මාත් එක්ක තරහ වෙන්න ඕනේ. මට බය හිතුනා ඔයාලත් එක්ක කතා කරන්න මේ ඔක්කොම වුණේ මම හින්ද නේ ඒකයි " යැයි සමීර දුක්මුසු මුහුණින් කියා සිටියේය.

"කමක් නෑ සමීර දැන් ඒක වෙලා ඉවරයි නේ. අපි ආයෙත් ආවා නේ. අනික ඔයා එහෙම කළේ නැත්නම් අපිට මේ වගේ අත්දැකීමක් ජීවිතේ ට ගන්න වෙන්න නෑ. " යැයි මා කියූ සැනින් සමීර විසින් සිනහාමුසු මුහුණක් පෙන්වූ අතර මාගේ පිට ප්‍රදේශයට යම් අයෙක් පහරක් එල්ල කළේය. ඒ චාමර විය.

ඔහු සමීර සහ මාකතා කළ තැනට විත්

"සුභ උදෑසනක් ගයාන්. ඔයාටත් සුභ උදෑසනක් සමීර යැයි " සිනහා මුසු මුහුණින් කිව්වේය.

# නිමි....

පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවතර්නයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත් පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වධර්නය ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිමර්ාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාථර් ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පයෙර්ෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාතර්ාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සම සමුදායක්ක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිමර්ාණාත්මක හැකියා හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම කරන කැඩපතකි.

මෙම නිමර්ාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්තිය සම්පාදකයින් සහ සැලසුම් කරුවන් ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාශර්වයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව ිද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නටට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්තා කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාප් ව්‍යාපෘතියෙ නිමර්ාපක

2023.11.01